කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

වෙදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු /සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව DMAT E3025

නාට්‍ය නිර්මාණය හා විචාරය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි — කාලය : පැය 03 යි

---

01. "නාට්‍ය පිටපත යනු සැකිල්ලක් පමණි. එය ජීවමාන නිර්මාණයක් බවට පත් කරන්නේ අධ්‍යක්ෂවරයා ඇතුළු නළුනිළි කැළ විසිනි." මෙම ප්‍රකාශය නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය සැලකිල්ලට ගනිමින් පැහැදිලි කරන්න.

02. චරිතයක් සාර්ථක ලෙස නිරූපණය කිරීමට, නළුවකු විසින් ප්‍රගුණ කළයුතු හා පිළිපැදිය යුතු දේවල් පිළිබඳ විමර්ශනයක් කරන්න.

03. රංගාලෝකය නාට්‍ය නිර්මාණයකට අවශ්‍ය වන්නේ ඇයි? රංගාලෝකය මගින් ඉටුකර ගත හැකි කාර්යයන් කෙරෙහි අවධානය යොමු කරමින් විස්තර කරන්න.

04. වේදිකා නාට්‍යයකට සංගීතය නිර්මාණය කිරීමේ දී සංගීත අධ්‍යක්ෂවරයා විසින් සැලකිල්ලට ගතයුතු කරුණු මොනවාද?

05. "රංගභූමි අලංකරණයට යොදා ගන්නා පසුතල හා සැරසිලි නාට්‍යයක් සාර්ථක වීමට මෙන්ම අසාර්ථකවීමට ද හේතු විය හැකිය." සාකච්ඡා කරන්න.

06. "නාට්‍ය කෘතියක් වූ කලී සමාජයේ කැඩපතකි." ප්‍රකට නාට්‍යවලින් උදාහරණ සපයමින් මෙම ප්‍රකාශය විමැසුමට ලක් කරන්න.

07. සෞන්දර්යාත්මක ආකල්පය යනු කුමක් දැයි පැහැදිලි කොට, නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයා තුළ ජනිත විය හැකි සෞන්දර්යාත්මක නොවන ආකල්ප මොනවා දැයි විවරණය කරන්න.

08. හොඳ නාට්‍ය විචාරකයකු සතුව අවශ්‍යයෙන් ම තිබිය යුතු ගුණාංග හා සුදුසුකම් මොනවා දැයි හේතු සහිතව පෙන්වා දෙන්න.

09. ඔබ නරඹා ඇති සාර්ථක නාට්‍යයක් නම් කොට එහි සාර්ථකත්වයට හේතු වූ කරුණු මෙන්ම අඩුපාඩු වේනොත් ඒවා ද පෙන්වා දෙමින් පුවත්පතකට විචාරයක් ලියන්න.

****************************